හොඳ සිංහල

වි ක ධර්මබන්ධු

උදා වූ නව මස පැතුමන් සපල වන හැම දුක් ගැහැට දොම්නස දුරින් දුරු වන එකක් වේවා ! සාමය සතුට අගයන ලෝ වැසි සද්දනන් හට මා හඳ පත්ලෙන් නැගි සිසිල් උණුසුම් සුපැතුමක් මේ

මේ සමර රිතුවේ නොහොත් නත්තල් සමයේ ඔස්ට්‍රේලියාව ඇතුලු සමකයට දකුනේ පිහිටි සමහර රටවල උනුසුම තදය. සමකයට උතුරේ පිහිටි සමහර රටවල සීතල තදය. නත්තල් දාත් බොක්සින් දාත් පර්ත් සිටියේ උනුසුම 44ද - 45 ද අතර විය. උනුසුම හා සබැඳි ආපදාවන් නිසා සමහරුන් රෝහල් ගත වූ සැටිත්, තවත් කෙලි ලොල් සමහරුන් ගගේ මුදේ බැස ඩා නිවා ගන්නා සැටිත් ටෙලිවිස්නෙන් පෙන්වන ලදී.

තද උනුසුම නිසා ඉබේ හට ගත් ලැව් ගිනි මෙන් ම, බල්ලන්ට වූ 'ද්වේස ප්‍රේමී වීරයන්' තම කැසිල්ල මැඩලනු පිනිස අවිලුවන ලද ලැව් ගිනි නිසා සිදු වූ විපත ද ටෙලිවිස්නෙන් දැක ගත හැකි විය. ඒ වීරයන්ට ගිනිමැලයක උනුසුම විඳීමට සැලැස්වීමේ ක්‍රමයක් මේ රටේ නැත. අඩුම ගනනේ 'කස පහස' ලබා දීමේ ක්‍රමයක් වත් නැත. මුලු රටම ගිනි තියන එකාටත් මානව හිමිකම් ලැබේ.
(ඒ ගැන අපට කල හැකි දෙයක් නැත)

ඒවා කෙසේ වෙතත් මගේ අලුත් අවුරුදු සුපැතුම උනුසුම් එකක් විය යුතු ද? යන දෙගිඩියාව මගේ සිතට බරක් විය.

දෙවියන් නිසා හෝ බලකාමය නිසා හෝ ලොව පුරා පැතිරී ඇති යුධ ගිනිත් නිසා දැඩි උනුසුමින් පීඩාවට පත් වුවන්ට මගේ අලුත් අවිරුදු සුපැතුම සිසලසක් වේවා !

සමහරු උනුසුම ම පිය කරති. මහ දවල් අවි පූටකේ අඩ නිරුවතින් වැල්ලේ දපා සිටින නව යෝනන් ගැන සිතන විට ඒ අදහස සනාත වේ. උනුසුම පිය කරන එබඳු ඇත්තන්ට මගේ අලුත් අවිරුදු සුපැතුම උනුසුම් එකක් වේවා ! සමර සමයේ ලැව් ගිනිත්, දෙවියන් නිසා හෝ බලකාමය නිසා හෝ ලොව පුරා පැතිරී ඇති යුධ ගිනිත් නිසා දැඩි උනුසුමින් පීඩාවට පත් වුවන්ට මගේ අලුත් අවිරුදු සුපැතුම සිසලසක් වේවා ! එසේ ඒ දෙපසම ගැන සිතා මගේ සුපැතුම උනුසුම් - සිසිල් එකක් කෙරිමි. (කැරිමි. කලෙමි)

ඉහත සඳහන් වැකිය 'කලෙමි' යනුවෙන් අවසන් නොකොට 'කෙරිමි/කැරිමි' යන නුහුරු - වැරදි ලෙස පෙනෙන වචනයකින් අවසන් 'කෙරුවේ' (කලේ) ඇයිදැයි ඔබ සිතන බව මම දනිමි. අලුත් අවුරුද්දේ හොඳ සිංහල ලිපිය ඒ සඳහා වෙන් කරමු.

'ධාතු' යන සකු වචනය සිංහලට බිඳෙන්නේ 'දා' යනුවෙන් බව අප හොඳින් දන්නා 'දළදා මන්දිරයෙන්' සනාත වේ. ඒ නිසා දා - දාව - දාවෙන් - දාවට - දාවේ වැනි වචන අපට නුහුරු නැත. මා මේ ලිපියේ 'ධාතු' වෙනුවට 'දා' ලියන බව ඔබේ දැන ගැනීම සඳහා මුලින් ම සඳහන් කරමි. ඒ අතර මෙයද මතක තබා ගන්න. දන්ත - දත් , ධාතු - දා, මන්දිරය - මැදුර, දන්ත ධාතු මන්දිරය, දත් දා මැදුර - දාඨා - දළ, ධාතු - දා, මන්දිරය - මැදුර, දාඨා ධාතු මන්දිරය - දළදා මැදුර, 'දත්' යනුවෙන් කීම හැඩ නැති නිසා දන්ත දාතු මන්දිරය දළදා මන්දිරය (මැදුර) වහරට පැමිණි බව පෙනේ.

තර, දර, මර, වර, සර, කිර, තෝර, දිර, නෙර, වීර, පුර, බුර, බේර, සාර, සූර ආදී දාවන් වර නැගෙන්නේ එකම විදියටය. 'මර' දාව, මරා (ය) - මරති - මැරී (ය) - මැරෑ (හ) යනුවෙනුත්

'පීර' දාව, පීරා (ය) - පීරති - පීරී (ය) - පීරූ (හ) යනුවෙනුත් වර නැගෙන බව ඔබ දනිති. මෙහි දැක්වෙන අනෙක් දාවන් ද වර නැගෙන්නේ ඒ විදියටමය.

'මර' දාවට 'නු' එකතු (මරුනු) හැඳෙන 'මරනු' යන නාමය ක්‍රියාව, මරන්නේය/මැරුවේය - මරන්නීය/මැරුවාය - මරන්නෝය/මැරුවෝය යනුවෙනුත් (පීරුනු) 'පීරනු' යන නාම ක්‍රියාව, පීරන්නෝය/පීරුවෝය යනුවෙනුත් වහරේ පවතින්නේ. අනෙක් දාවන්ට 'නු' එකතු කොට මේ විසියටම වර නගා බලන්න.

දැන් අපි 'කර' දාවත් ඒ විදියටම වරනගා බලමු.
'කර' :කරා(ය) - කරති - කැරී(ය) - කැරෑ(හ), 'කරනු' :
කරන්නෝය/කැරුවේය - කරන්නීය/කැරුවාය කරන්නෝය/කැරුවෝය යනුවෙනි එයත් වර නැගිය යුත්තේ. එහෙත් එය වෙනස් වී ඇත.
'කර' :කරා(ය) - කරති.... කලහ
, 'කරනු' :
කරන්නෝය/කෙලේය - කරන්නීය/කලාය - කරන්නොය/ කලෝය.

මෙහි අතීත කාල ඒක වචන නාම ක්‍රියාව යෙදී ඇත. කැරුවේය. යන්න 'කෙලේය' යනුවෙනුත්, කැරුවාය යන්න 'කලාය' යනුවෙනුත්, කැරුවේය යන්න 'කලෝය' යනුවෙනුත් වෙනස් රූපයක් ගෙන ඇත. කැරෑහ යන්න ද 'කලහ' යනුවෙන් වෙනස් වී ඇත. එසේ 'කර' දාව පමණක් වෙනස් වූයේ ඇයි දැයි කියන්නට මම නොදනිමි. වෙනස එතනින් නැවතී නැත. 'අ' හඬ මුලට ඇති හැම පදයක්ම විවෘත හඬින් පටන් ගැනීම අපේ බාසා රීතියයි. ඉංගිරීසි බාසාවේ ඇති අකෝඩියන්, අවෝඩ්, කමෝඩ්, කන්ටේන වැනි වචන අපට නැත. එහෙත් 'කර' දාව කරා(යි) - කරති - කලහ - කලේය - කලාය - කලෝය - කරවා(යි) - කරවති - කරකර - කරමින් ආදී හැම පදයකම මුලින් ඇති 'ක' යන්න සංවෘත හඬ නංවන සැටි බලන්න. කැරිය-කැරෑහ-කෙරුවේය-කෙරුවාය-කෙරුවෝය වහරේ නැතත් කැරවීය - කරැවූහ - කෙරෙව්වේය - කෙරෙව්වාය - කෙරෙව්වෝය වහරේ දක්නට ඇති සැටි බලන්න.

අප වහරන 'වන - කර - කරන - කරවනු' වැනි වචන කීමේ දී අපේ දිවට ගායක් ද නො දැනේ. ප්‍රව්‍රිතිය, ක්ෂිතිජය, ක්‍රිත්ම යන වචන කීමේ දී දිවට ඇති වන ගාය මඟ හරවා ගැනීම සඳහා අප ඒ වචන ප්‍රවූර්තිය, සිතිජය, ක්‍රුතිම යනුවෙන් කියන සැටි ගැන සිතන්න.

මම අය්යා ලවා ගැටය තද කැරැවීම්
මම ම ගැටය තද කැරිමි
මම අය්යා ලවා සාල් ගැරැවීම්
මම ම සාල් ගැරිම,
මෙතන ගැටලුව ඇත්තේ 'තද කෙලෙමි' යි නොලියන 'තද කැරිමි' යනුවෙන් ලිවීමෙහිය. සිංහල බාසාව ඉගෙන ගන්නා පිටරැටියෙකු අතින් ඒ වැකිය ලියවුනොත් එය පුදුමයක් නොවේ.

අප නොදන්නා කිසියම් හේතුවක් නිසා වහරට නොපැමිනි, එහෙත් එය වහරට ගැනීම නිවැරදි යයි සිතන පදයක් වහරට ගැනීම වරදක් වන්නේ කෙසේ ද? මම අද කරයි - කරති - කැරිය - කරෑහ යනුවෙන් ලියමි. කරයි - කරති - කලේය - කලහ යනුවෙන් ලියන අය මුව අයාගෙන මා දෙස බලා සිටිනු ඇත. හෙට තව එකකු,අනිද්දා දෙතුන් දෙනෙකු, ඉන් අනිද්දා හතර පස් දෙනෙකු ලියූ විට ඔවින් කර බා ගනු ඇත.

බස් පාරේ වල ගොඩෙැලි සම කිරීම නොකලයුතු වැඩක් වන්නේ කෙසේ ද?

සුභාෂිතයෙන්

කුලුනු ගුනෙන් යුතු උතුමන් සිත මහරු
දුදන බසින් නොයෙදෙයි කරනට නපුරු
නව රුවනින් පිරි මහ සමුදුර ගැඹුරු
තන සුලෙකින් හුනු කල හැකි වෙති කදරු

පදාවලිය හෙවත් නිසැඳැස් කව
කුලුනු ගුනෙන් යුතු
මහරු උතුමන් සිත
දුදන බසින්
නපුරු කරන්නට නොයෙදෙයි
නව රුවනින් පිරි
ගැඹුරු මහ සයුර
කව්රු
තන සුලෙකින්
හුනු කල හැකි වෙද ?

(අදහස) පෝරුම:
කරුනා ගුනයෙන් යුක්ත වූ
පිදුම් ලැබිය යුතු උතුමන්නේ සිත
දුදනන්නේ වචනවලින් (උසි ගැන්නීමෙන්)
නපුරු කල නොහැකිය
එය හරියට
නව රුවනින් හෙවත්
මැනික් වර්ග නවයෙන් පිරුනා වූ
ගැඹුරු මහ මූද
කිසිම කෙනෙකුට
වියලි තන කොල මිටියකින් සැදු
හුලු අත්තකින් උනු කර ලන්නට
නොහැක්කා මෙනි.

නව රුවන් (නව රත්න) - මැනික් වර්ග නවය,

එනම්: 1. මුතු , 2. මැනික්, 3. වයිදූර්ය (වීදුරු), 4. ගෝ මේද, 5. වජ්‍ර (වීදුරු), 6. පබලු, 7. පද්මරාග, 8. මරකත, 9. ඉඳුනිල් බව අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව කියයි. මැනික් නව වර්ගයට 2 මැනික් යලිත් වරක් මැනික් ඇතුලු වී ඇති බව පෙනේ. මුතුත් මැනික් ගොඩට වැටී ඇත. පබලු යනු කුමක් දැයි කීමට මම නොදනිමි. වයිදූර්ය හෙවත් වයිරෝඩිත් වජ්‍ර හෙවත් දියමන්තිත් යන දෙකම 'වීදුරු' යනුවෙනි සිය බසට බිඳෙන්නේ.

පිදුරු වැනි වියලි තන, මිටියක් කොට බැඳි විට එය තන සුලක් (ගිනි හුලක්) වේ. තන සුලකින් තබා විදුලි බොයිලේරුවකින් 'ගැඹුරු මහ සමුදුර' හුනු කරන්නට යෑම තබා සිතීම හොඳ සිහිය ඇති කෙනෙකු අතින් සිදු විය නොහැකිය. බුරුල්ල හෝ දඬ මිටක් මිරිකා මුහුදේ පෘය වෙනස් කිරීමට තැතනීම වැනි උපමාවක් මීට වඩා සුදුසු සේ පෙනේ. (පැනි මුලකින් මුහුදු වතුර මිහිරි කිරීමට තැත් කිරීමත් මීට සමානය.)

මහ මුහුදේ නව රුවන් පිරි ඇද්දැයි මම නොදනිමි. මහ මුහුදට තබා වතුර කොරහකට ගිනි හුලක් එබූ විට සිදු වන දේ ඔබ දනිති. මහ මුහුදේ ජල කඳ තරම් වන වතුර කඳක් බඳුනක දමා උනු කිරීම මෙහි අදහස ද?

වි. ක. ධර්මබන්ධු

Lead Accounting & Taxation Services
Public Accountant and Registered Tax Agent

Refunds within 14 days
Tax Returns 2007

ශ්‍රී ලාංකික ඔබට සුහද සේවය

Services
- Individual/ Business/ Investment Property Tax Returns
- Accounting/ Bookkeeping
- Preparation of Business Activity Statements(BAS)
- Audit of Non-for-Profit Organization and Self-Managed Superannuation Funds
- Personal Service and Advice

L. A. Dayananda Wimalasiri PNA
B.Com, M.Com, M.Bus, Ad.Dip.Acct.

Office
1/1324 Centre Rd, Clayton 3169
TP 03 9544 4995
Fax 03 9544 4997

After Hours
7 Whitton Court, Rowville 3178
P/F 03 9755 7400
M 0402 846 676

leadtax@iprimus.com.au

NIA NATIONAL INSTITUTE OF ACCOUNTANTS
PNA

Kusumsiri - Lead Design House 0430 112 088